# මගේ පාසල් ගමන




රිසිඳි දිහාසා ගුණරත්න

# මගේ පාසල් ගමන

රිසිඳි දිහාසා ගුණරත්න

ISBN-978-624-208-046-8

දිනය: 2023-12-09

# පිදුම

මේ පොත සැකසීමේදී මා හට

උදව් කල මාගේ දෙමාපියන්ටත්

මාගේ පන්තිභාර ගුරු මෑණියන්ටත්

මහාමායා බාලිකා විදුහලේ

විදුහල්පතිතුමියටත්,

ආදරයෙන් පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් '' දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ '' දිවිය දිනන විද්‍යුත් පොතක්'' ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලෙඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමණාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාව්පියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය -මහනුවර
2023.10.20

මා ඉපදුණ දා සිට, මගේ ජීවිතය කියා දෙන පාසලට යෑමට ඉතා කැමත්තෙන් සිටියෙමි. එම දිනය උදා වෙන තුරු මම නොඉවසිල්ලෙන් සිටියෙමි. ඒ සඳහා තිබුණේ තව දින කිහිපයකි.






මා පාසලට යෑමට ඉතා කැමතියි. මම පළමු පාසලට යෑමට අවශ්‍ය උපකරණ ගත්තෙමි. මා පොත් මැදුරෙන් ඉවතට ගියේ මලු ගොඩාක් අරගෙනයි.

එදින ඉතා ලස්සන දවසකි. ඒ දිනය  මගේ සිතේ ගලේ කෙටූ අකුරක් සේ මතකයේ රැඳුණි. ඒ නිසා මට එය අමතක නොවෙයි. මා එදින ගෙදර ගියේ ඉතා සතුටිනි මා පාසල් බෑගය තුළට බඩු දමා ගත්තේද  එදිනම යි.






පසු  දිනය උදා විය. මා පාසලට යෑමට සූදානම් වුණි. සුදු ගවුමකින් සැරසී, සුදු සපත්තු ජෝඩුවක් දමා, කොණ්ඩ කරල් දෙකට සුදු පටි දෙකක් බැඳ, දෙමාපිය පා වැඳ  මම පාසැල් ගියෙමි.

‘‘නංගි මල්ලි බායි බායි’’

‘‘නැන්දේ මාමේ බායි බායි’’

‘‘ආච්චි සීයේ බායි බායි’’

මම අම්මා තාත්තා සමඟ පාසලට ගියෙමි.



මම 1 - A පන්තියට ඇතුළු වුණෙමි. එහිදී මාව මුලින්ම වැළඳ ගත්තේ මගේ ගුරුතුමියයි. ඇය දමයන්ති ගුරුතුමියයි. ඇය අපට බොහෝ සෙල්ලම් කියා දුන්නා ය. අපි ඒවා සතුටින් කළෙමු. මම පළමු ශ්‍රේණියෙන් දෙවන ශ්‍රේණියට ගියෙමි. මම එහි දී වෙස්, පිහිනුම් වැනි ක්‍රීඩා කළෙමි.






මම ඒවා කැපවීමෙන් හා උනන්දුවෙන් කළ නිසා මට එම ක්‍රීඩාවලින් සහතික, පදක්කම්, කුසලාන හිමි කර ගැනීමට හැකියාව ලැබුණි. මම 2 ශ්‍රේණියෙන් 3 ශ්‍රේණියට ගියෙමි. ඇය නෙරංජලා ගුරුතුමියයි. ඇය මගේ දක්ෂතා මෙන්ම අනිත් අයගේ දක්ෂතා ද අගය කළාය.




මම එහි දී මගේ වැරදි බොහෝ හඳුනා ගත්තෙමි මම නිවසේ දී පාසල් වැඩ කළෙමි. එපමණක් නොව මම ඒවා නැවත මතක් කළෙමි.

මා පාසල් වැඩ ඉතා සතුටින් ඉගෙන ගත් නිසා මට පාසල් වැඩ අමාරු වුණේ නැත. මම 5 ශ්‍රේණියට ඇතුළත් වුණෙමි. මම එහි දී ශිෂ්‍යත්ව විභාගය සඳහා සූදානම් වුණෙමි. ඔක්තෝබර් 15 වන ඉරිදා මම ශිෂ්‍යත්ව විභාගයට යෑමට සූදානම් වුණෙමි. බුදුරදුන්ගෙන් අවසර ගෙන විභාග ශාලාවට ගියෙමි. මම මට ලැබුණු අළුත් බඩුවලින් ශිෂ්‍යත්ව ලිවුවෙමි. ඒ සඳහා හොඳින් පිළිතුරු සපයා ඇතැයි මට සිතුණි.






මම ශිෂ්‍යත්ව ලකුණු
එන තුරු නොඉවසිල්ලෙන්
මඟ බලා සිටියෙමි, ටික
දවසකින් විභාග ප්‍රතිඵල
ලැබුණි. මම ශිෂ්‍යත්ව
විභාගයෙන් සමත් ය.
මටත්,
අම්මාටත්, තාත්තාටත්
වගේ ම මගේ පන්තිභාර
ගුරුතුමියටත් ගොඩක් සතුටත් දැනුණි.
මට ඉතා සතටක් දැනුණි. මෙම කඩයිම පසු කිරීමට උදවු
වුණ සෑම දෙනාට ම ස්තූති වන්ත වුණෙමි.

මෙය මගේ පාසල් ගමනයි.

නිමි!

# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු


මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20